**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 26 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම රු.4,766,135 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වල එය රු.4,205,437 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.560,698 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවන ලද ණය වාරික 12 ක වටිනාකම වූ රු.824,372 ක් ණය මුදලින් අඩු නොකිරීම හේතුවෙන් දිගුකාලීන වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂ දෙක සඳහා ලැබී තිබුණු පරිසර බලපත්‍ර ගාස්තු රු.96,000 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල් කිරීම් රු.8,000,000 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.9,955,520 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායම් රු.1,955,520 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ බිල් කිරීම් රු.5,500,000 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.9,475,675 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.3,975,675 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු උසාවි දඩ ආදායම් රු.3,975,675 ක් වුවත්,එය රු.3,214,642 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.761,033 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ රු.152,600 ක් වටිනා පාරිභෝගික භාණ්ඩ විෂයයන් 108 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබීමෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාව මඟින් පෙන්වාදී තිබූ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

(i) විවිධ ණය හිමියන්ගේ වටිනාකම රු.1,817,998 කින් වැඩියෙන් දැක්වීම.

(ii) මුද්දර ගාස්තු ආදායම රු.1,000,000 ක් අඩුවෙන් දක්වා තිබීම.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

-----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 2 ක් සම්බන්ධව මූලා ප්‍රකාශන වල ශේෂය හා ලෙජර් ගිණුම් ශේෂය අතර රු.6,021,488 ක වෙනසක් පැවතුනි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 85,490,323 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂ 02ක් ඉක්මවූ හිඟහිටි වරිපනම් රු.2,673,460 ක් , හිඟහිටි විදුලි ගාස්තු රු.468,559 ක් ,හිඟහිටි අක්කර බදු රු.10,704 ක්, හිඟහිටි සතිපොල බදු රු.345,500 ක්, හිඟහිටි ජල ගාස්තු රු.1,069,640 ක්, හිඟහිටි කඩකුලී රු.512,690 ක් හා කර්මාන්ත ණයගැතියෝ රු.80,409,770 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.70,018,112 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය වර්ෂ 02 ක ඉක්මවූ ණයහිමි ශේෂය විය.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 93,686,753 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම**

-------------------

**1.3.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------------

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| | (i) | 49 වගන්තිය | | සභා බලප්‍රදේශය තුළ රථවාහන මාර්ග, සහ අනෙක් අත්‍යවශ්‍ය මාර්ග වලට යාබදව පවතින අනවසර ඉදිකිරීම් පරික්ෂා කර නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, අනවසර ඉදිකිරීම් 71 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 127 වගන්තිය | | (i) සභාව සතු පොදු සුසාන භූමි ආරක්ෂා වන පරිදි මැනුම් කර මායිම් සළකුණු සවි කර නොතිබුණි.<br>(ii) නිල්බෝවල සුසාන භූමි ඉඩමේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | 158,159 වගන්ති | 85,492,264 | සභාවේ ලේකම්වරයා විසින් හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. |
| (ආ) | | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය | | ගෝඝාතක ස්ථානයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | | 1981 අංක 60 දරන ගෝඝාතක (සංශෝධන) පනත සහ 2008 අංක 13 දරන ගෝඝාතක (සංශෝධන) පනතේ | | |
| | (i) | II වන පරිච්ඡේදයේ 4 වගන්තිය | | ගවයකු ඝාතනය කිරීමට පෙර “ඇ ”ආකෘති පත්‍රය ප්‍රකාරව ඉල්ලුම් පත්‍රයක් මඟින් අවසර ලබාගෙන නොතිබුණි. |
| | (ii) | III වන පරිච්ඡේදයේ 21 වගන්තිය | | 21 වගන්තියට පටහැනිව හාලිඇල ජුම්මා පල්ලියට අයත් යැයි සැලකෙන ස්ථානයක ස්ථාපිත ගොඩනැගිල්ලක ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාමට හා මස් ප්‍රවාහනය කිරීම සඳහා සභාව විසින් බලපත්‍ර ලබාදී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | III වන පරිච්ඡේදයේ 22 වගන්තිය | | ගවයන් ඝාතනය කරන ස්ථානය දෛනිකව සූතිකාගාර පාලකයකුගේ හා මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකුගේ අධීක්ෂණයට භාජනය වී නොතිබුණි. |
| (ඇ) | 1988 මුල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ | | |
| | රීති 217 හා 218 | | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලු ඉඩම් ගොඩනැඟිලි ප්‍රා.ස46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණය කර සභාවට වාර්තා කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | | |
| | xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | 153,723 | සභාවේ සේවය අත්හිටවූ හා මියගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මුදල් රෙගුලාසි 142(1) | | සභාව සතු ඉඩම් ගොඩනැඟිලි හා ව්‍යාපාරික ස්ථාන 22 ක් කුලියට දීමේ දී රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371 | 769,617 | සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවස්ථා 09 දී ලබාදෙන ලද වර්ෂ 04 සිට වර්ෂ 07 ඉක්මවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | 155,868 | වර්ෂ 02 ක් ඉකුත් වූ තැන්පත් 05 ක් නියාදනය කිරිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,943,245 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,891,090 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,969,820 | 4,184,719 | 2,434,810 | 1,749,908 | 3,929,820 | 4,000,416 | 2,587,232 | 1,413,183 |
| (ii) | කුලී | 1,466,302 | 1,436,909 | 1,123,068 | 313,841 | 1,528,372 | 1,185,234 | 1,120,465 | 64,768 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,324,400 | 2,468,545 | 2,468,545 | - | 2,172,400 | 1,934,775 | 1,934,775 | - |
| (iv) | වෙනත් ආදායම | 4,119,250 | 2,144,479 | 2,144,479 | - | 2,456,500 | 842,868 | 842,868 | - |
| | එකතුව | 11,879,772 | 10,234,652 | 8,170,902 | 2,063,749 | 10,087,092 | 7,963,293 | 6,485,340 | 1,477,951 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 10.2 ක් වූ අතර,වර්ෂය තුළදී රැස්කළ ආදායම රුපියල් මිලියන 8.2 ක් විය. වර්ෂය අවසාන වනවිටත් රුපියල් මිලියන 2.1 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර,ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 40 කින් වැඩි වී තිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ රු16,432,813 ක් සහ මුද්දර ගාස්තු රු6,771,204 ක් අය කරගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

1987 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට අතුරු ව්‍යවස්ථා 20 ක් පමණක් පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරික්ෂණය විය.

(i) 2016 ජනවාරි 18 දිනැති පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/15/10/33 දරන ලිපිය ප්‍රකාරව ඝණ අපද්‍රව්‍ය රැස්කිරීමේදී, දිරන /නොදිරන ලෙස තෝරා වෙන්කර භාරගත යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින දක්වා එසේ කටයුතු කර නොතිබුණි.

(ii) කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදාගත හැකි අපද්‍රව්‍ය හා කොම්පෝස්ට් හැලීමෙන් පසු ඉතිරිවන කොටස්, කොම්පෝස්ට් අංගනයට අයත් නොවන භූමියක ගොඩ ගැසී ඇති කසළ, ඇල මාර්ග මගින් බදුළුඔයේ ජලයට මිශ්‍රවීම හේතුවෙන් පාරිසරික ගැටළු රාශියකට මුහුණදීමේ අවදානමක් පැවතුණි.

(iii) කොම්පෝස්ට් අංගනය තුළ සේවකයින් 09 දෙනෙකු සේවයේ යොදවා තිබුණද කසළ හැලීම සඳහා අවශ්‍ය උපකරණ හා ඔවුන් වෙනුවෙන් මාසික වෛද්‍ය පරික්ෂාවන් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) 2013 දෙසැම්බර් 24 දින සභාව වෙත ලැබී තිබුණු රු.3,480,000 ක් වටිනා ගලි බවුසරය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ලියාපදිංචි කර භාවිතා කර නොතිබීම හේතුවෙන් ගලි බවුසර් සේවාව ඉටු කිරීමට සභාව අපොහොසත්වී තිබුණි.

(ආ) මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව තිබුණු නිල්බෝවල සුසානභූමිය පිහිටි ඉඩම ප්‍රදේශවාසීන් විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණු අතර, ඉඩම නිරවුල් කර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මුගුනුමත බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අංක 882 දරන රූඩ් 02 යි පර්චස් 6.9 ක් වූ ඉඩම දීර්ඝ කාලීනව 2012 සැප්තැම්බර් 09 දින බදු දී තිබුණි.ගිවිසුම් ප්‍රකාරව වාර්ෂිකව රු.48,000 බැගින් අය විය යුතු වුවත්, 2016, 2017 හා 2018 වර්ෂ වලට අදාලව රු. 144,000 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 05 ක් හා අතිරික්ත සේවකයින් 59 ක් වූ අතර, සේවක අවශ්‍යතාවය තුලනය කරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආදායම් රැස්කිරීම සඳහා ස්ථාපිත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශණය කිරීම සඳහා වර්ග අඩියකට රු.50 ක් අයකළ යුතු වුවත්, බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 15 ක් වෙනුවෙන් රු.154,400 ක ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුළ කුලී වෑන් රථ හා ත්‍රීරෝද රථ ගාල්කර ඇති ස්ථාන සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

--------------------------------

3.5.1 **නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) සභාව මිළදීගෙන තිබුණු මෝටර් ග්‍රේඩරය,ගලි බවුසරය හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් නිශ්කාර්යව සභාව තුළ ගාල් කර තිබුණි.

(ආ) සභාව සතු ට්‍රැක්ටර් රථයක් අලුත්වැඩියා කිරීමෙන් තොරව ගාල් කර තිබුණි.

3.5.2 **වත්කම් ලේඛනගත නොකිරීම**

-----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 17(3) වගන්තිය හා 127 වගන්ති අනුව සභාව සතු සියලු ඉඩම්,සුසානභූමි නිශ්චිතව හඳුනාගෙන,මිණුම් කර,ලේඛන පවත්වාගෙන යායුතු වුවත්,ඉඩම් කැබලි 167 ක් පිළිබඳව එසේ කටයුතු කර නොතිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

-----------------

3.6.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.6.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

**ඇටම්පිටිය නගරයේ ජල යෝජනාක්‍රමය සඳහා ජල ටැංකි දෙකක් ඉදිකිරීම.**

------------------------------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉදිකිරීම් සිදු කළ ඉඩමේ අයිතිකරුගේ කැමැත්ත ලබාගෙන නොතිබුණු අතර, ටැංකි දෙකක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද, එක් ටැංකියක පමණක් වැඩ අවසන් කර තිබුණි.

(ii) PVC ජලනල මීටර් 200 ක් සැපයීම හා සවිකිරීම සඳහා මීටරයකට රු.1,792 බැගින් රු.358,400 ක් ගෙවා තිබුණු අතර, භෞතික පරීක්ෂා කිරීමේ දී PVC ජලනල මීටර් 108 ක් පමණක් එලා තිබුණි. ඒ අනුව මීටර් 92 ක් වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල රු.175,616 ක් විය.

(iii) PVC ජලනල මීටර් 100 ක් සඳහා එක් මීටරයක් සපයා සවිකිරීමට රු.1,073 බැගින් රු.107,300 ක් ගෙවීම් කර තිබුණද, භෞතික පරීක්ෂා කිරීමේ දී මීටර් 28 ක් පමණක් එලා තිබුණි. ඒ අනුව මීටර් 72 ක් සඳහා රු.77,256 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) ඉංජිනේරු සම්මතයන්ට අනුව ජල නල එළීමේ දී අවම වශයෙන් පොළොවේ මතුපිට සිට අඩි දෙකක්වත් ගැඹුරින් ජලනල එළිය යුතු වුවත්, එලූ ජලනල පොළොවේ මතුපිටට නිරාවරණය වී තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරික්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහල මට්ටමක පැවතීම. |
| | | (ii) | දිගු කාලයක් හිඟව පවතින ආදායම් අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන නොතිබීම. |
| | | (iii) | ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍ර පරික්ෂණ කටයුතු අධීක්ෂණය නොකිරීම. |
| | | (ii) | කර්මාන්ත අධීක්ෂණය හා පරිපාලනය සඳහා වාර්තා නඩත්තු නොකිරීම.(මාර්ගලේඛනය,ගොඩනැගිලි ලේඛනය) |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | සභාව සතු ඉඩම් ගොඩනැගිලි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | වත්කම් පන්තිය අනුව වර්ගීකරණය කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| | | | සභාව සතු ඉඩම් සුසාන භූමි මැණුම්කර නිශ්චිතව වෙන්කර නොගැනීම. |